C
373
KAL

# ශ්‍රී ලංකාවේ 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයේ කාර්යක්ෂමතාව ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක්

( මහනුවර අධ්‍යාපන කලාපය ඇසුරින්.)

# A study of the New Trends Regarding the Efficiency of the Year 5 Scholarship Examination in Sri Lanka.

( Based on a sample drawn from the Kandy Education Zone)

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පී කලුබෝවිල
B.A.Hon. (second Upper) Dip. in. Edu. ( Merit)

නිබන්ධන උපදේශක මහාචාර්ය එස් රූපසිංහ මහතා
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ.

අධ්‍යාපන දර්ශනපති උපාධි නිබන්ධය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය

1997

5080090

UNIVERSITY OF PERADENIYA
27-8-1998
LIBRARY

## සාරාංශය

1995 වසරේදී සංශෝධනයට ලක්ව නව රටාවකින් පැවැත්වෙන 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයේ කාර්යක්ෂමතා මට්ටම තක්සේරු කර බැලීමත්, එය 1995 ට පෙර පැවැත් වූ පරීක්ෂණ කාර්යක්ෂමතා මට්ටම් හා සසඳා බැලීමත් මෙම අධ්‍යයනයේ අභිප්‍රාය විය. ඉගෙනුම් හැකියා සහ විභව්‍යතා මත සිසුන් වර්ග කිරීම අරමුණු කරගත් මෙබඳු මිනුම් ක්‍රමයක නිරවද්‍යතාව රඳා පවතින්නේ අදාළ පරීක්ෂණයේ කාර්යක්ෂමතා මට්ටම මත බව අධ්‍යාපනික මිනුම් ක්ෂේත්‍රයේ පිළිගැනීමයි. ඒ මත පදනම්ව 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයේ කාර්යක්ෂමතාව කෙරෙහි එල්ල වී තිබූ විවේචන පිටු දැකීම 1995 දී සිදු කළ නව සංශෝධනයන්ගේ වැදගත් අරමුණක් විය. ඒ අනුව සංශෝධිත පරීක්ෂණ අදාළ කාර්යයෙහි ලා පෙන්වා ඇති කාර්යක්ෂමතා මට්ටම විමර්ශනයට ලක් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

1995 දී පැවැත් වූ සංශෝධිත නව රටාවේ 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයේ 1 පත්‍රය මහනුවර අධ්‍යාපන කලාපයට අයත් පාසල් හතක ළමුන් 400 දෙනෙකුට පෙර පරීක්ෂණයක් ලෙස ලබා දී ඊට ලද ශිෂ්‍ය ප්‍රතිචාර භාවිතයෙන් සිදු කළ වනු විශ්ලේෂණය අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ කාර්යය විය. මෙම වනු විශ්ලේෂණ අනාවරණයන් ක්ෂේත්‍රයේ පිළිගත් වනු කාර්යක්ෂමතාවේ නිර්ණායක මට්ටම් හා සසඳා බැලීමක් සිදු කරන ලදී. තවද පරීක්ෂණයක කාර්යක්ෂමතාව ආරක්ෂා කෙරෙන ඇතැම් තාක්ෂණික ගුණාංග සංශෝධිත හා සංශෝධනයට පෙර පරීක්ෂණවල අඩංගු වූ ප්‍රමාණයන්ද සැසඳීමට ලක් විය. මෙම විශ්ලේෂණයන්ගේ අනාවරණයන් වැඩි දුරටත් අර්ථවත් කර ගත හැකි වන පරිදි පරීක්ෂණයේ විෂය කරුණු මූලික වලංගුතාව තක්සේරු කර බැලීමක්, පරීක්ෂණ කාර්යක්ෂමතාව පිළිබඳව ඉහළ ප්‍රාථමික පන්තිවල ඉගැන්වීමේ නිරත ගුරුවරුන් නියැදියක අදහස් විමසා බැලීමක් සහ 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයේදී ජාතික මට්ටමින් සිසුන් ලද ලකුණු ව්‍යාප්තින් සසඳා බැලීමත් යන විමර්ශනයන් ප්‍රධාන පර්යේෂණ කාර්යයට අනුපූරක වශයෙන් සිදුකරන ලදී.

වික්ෂේප ප්‍රතිචාර නිර්ණායක අගයයන් හැර වනු විශ්ලේෂණයෙන් ලද අනෙකුත් දර්ශක අගයයන් ක්ෂේත්‍රයේ පිළිගත් එම දර්ශක අගයයන් ආශ්‍රිත කාර්යක්ෂමතාවේ නිර්ණායක මට්ටම් කරා ළඟා වී තිබුණි. සංශෝධිත පරීක්ෂණයන්ට අදාළ විෂයකරුණු මූලික වලංගුතාව සංශෝධනයට පෙර පරීක්ෂණවලට සාපේක්ෂව සැලකියයුතු වර්ධනයක් ලබා තිබූ බැව් තහවුරු විය. වැඩි ප්‍රතිචාර සංඛ්‍යාවකදී සංශෝධිත නව රටාවේ පරීක්ෂණ කාර්යක්ෂමතාව පිළිබඳව ගුරුවරුන් තුළ ධන ආකල්ප වර්ධනය වී ඇති බව සනාථ විය. තවද ශිෂ්‍යත්ව පරීක්ෂණ සඳහා ජාතික මට්ටමින් සිසුන් ලද ලකුණු ව්‍යාප්තින් ඇසුරින් ප්‍රදර්ශනය කෙරෙන පරීක්ෂණ කාර්යක්ෂමතා මට්ටම් සංශෝධනයට පෙර හා සංශෝධනයෙන් පසු පරීක්ෂණ වශයෙන් සැලකිය යුතු වෙනසක් පෙන්වා ඇති බවටද ප්‍රමාණවත් සාක්ෂි ලැබී තිබුණි.

අවසන් වශයෙන් මෙම අධ්‍යයනයට ඇතුළත් කරගත නොහැකි වූ එහෙත් ඊට අදාළව සිදු කළ හැකි පරීක්ෂණ කාර්යක්ෂමතාවට අයත් පර්යේෂණාත්මක ඉඟි කිපයක්ද මෙම අධ්‍යයනය තුළින් සැපයේ.